සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

9 ශ්‍රේණිය | පෙරදිග සංගීතය | කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

## I - කොටස

- **සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ''දුනුකෙයියා මලක් වගේ, ආදරයේ උල්පත වූ, සියක් ආයු ලැබ'' මෙම ගීත,

(1) පියගුණ ගීත කීපයකි. (2) මව්ගුණ ගීත කීපයකි.

(3) දේශාභිමානී ගීත කීපයකි. (4) ළමා ගීත කීපයකි.

02 රාගයක ආරෝහණයේ හා අවරෝහණයේ යෙදෙන ස්වර සංඛ්‍යාව අනුව රාගයක ජාතිය තීරණය වේ. එසේ නම් භූපාලි රාගයේ ජාතිය කුමක් ද?

(1) සම්පූර්ණ සම්පූර්ණ (2) ෂාඩව, ෂාඩව

(3) ඖඩව, ඖඩව (4) ඖඩව, සම්පූර්ණ

03 | x x x | x x x x | x x x | x x x x | මෙම රිද්ම රටාවට ගැලපෙන හින්දුස්ථානි තාලය කුමක් ද?

(1) දාදරා තාලය (2) දීප්චන්දි තාලය (3) ජප් තාලය (4) ත්‍රිතාලය

04 බිලාවල් රාගයේ අනුවාදී ස්වර ලෙස ගතහැකි වන්නේ,

(1) ස රි ම ප නි (2) ස රි ම ප ධ (3) ස රි ග ම ප (4) ස රි ග ප සං

05 EADGBE ලෙස තත් සුසර කරන බටහිර සංගීත භාණ්ඩය වන්නේ,

(1) වයලීනය (2) එස්රාජය (3) ගිටාරය (4) සිතාරය

06 බොත්තම් මගින් කෝඩ්ස් වාදනය කරන ස්වර පුවරුව සහිත වාද්‍ය භාණ්ඩය කුමක් ද?

(1) සර්පිනාව (2) මෙලෝඩියන් (3) පියානෝව (4) එකෝඩියන්

07 සර්පිනා භාවිතයේ දී ගුණාත්මක භාවය ආරක්ෂා කිරීමට අනුගමණය කළ යුතු වඩාත් සුදුසු පියවර කුමක් ද?

(1) ස්ටෝපර්ස් නැවත ඇතුලට යොමු කිරීම හා උඩ ලී ආවරණය යථා පරිදි ස්ථානගත කිරීම.

(2) භාවිතා නොකරන අවස්ථාවල දී බැලෝ එක ලොක් නොකර නිදහසේ තැබීම.

(3) ශ්‍රැති ස්වරය පවත්වා ගැනීම සඳහා යතුරු සම්බන්ධ ටෙන්ෂන් කම්බි නැවීම හා දිග හැරීම.

(4) නිතර භාවිතයේ දී පහසුවන ආකාරයට උඩ ලී ආවරණය සැමවිටම ඉවත් කර තිබීම.

08 ග ප ධ නි | ස̇ - ධ ප | ම ග ම රි | ස රි ස - | මෙම ස්වර ප්‍රස්ථාර කොටස බිලාවල් රාගයේ,

(1) සර්ගම් ගීයට අයත් වේ. (2) ලක්ෂණ ගීයට අයත් වේ.

(3) මධ්‍යලය ගීයට අයත් වේ. (4) රාගාශ්‍රිත ස්වරස්ථාපන ගීයට අයත් වේ.

09 ස රි ග ම ප ධ නි ස̇ ......... යන ස්වර සප්තකය භූපාලි රාගයේ ආරෝහණයට අනුව සැකසීමේ දී ඉවත් කළ යුතු ස්වර දෙක වන්නේ කුමක් ද?

(1) ම හා නි (2) ග හා නි (3) රි හා ධ (4) ම හා ප

10 ප ධ නි ස̇ රි̇ ග̇ ම̇/ ප̇ ලෙස ස්වර යෙදෙන Major Scale ය, (ස්වර අෂ්ඨකය) කුමක් ද?

(1) F (2) G (3) C (4) $B^b$

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට පහත සඳහන් තොරතුරු ඇසුරින් හිස්තැන් පුරවන්න.**

★ ක්ලැරන්ස් විජේවර්ධන
★ නෙවිල් ප්‍රනාන්දු
★ ලොස් කැබලරෝස්
★ ලා සිලනියන්ස්
★ ෂෙල්ටන් ප්‍රේමරත්න
★ ජිප්සීස්
★ ත්‍රී සිස්ටර්ස්

11 සිංහල කණ්ඩායම් සංගීතයේ නිර්මාතෘවරයා ........................................................... මහතාය.

12 නොයෙල් බ්‍රයන් රණසිංහ මහතා නායකත්වය දැරූ සංගීත කණ්ඩයම වන්නේ .................................... ය.

13 60 හා 70 දශකයේ මෙරට බිහිවූ තවත් සංගීත කණ්ඩායම් දෙකකි ............................ සහ ............................ .

14 බොහෝ වියතුන් කණ්ඩායම් සංගීතය දුර්වල සංගීතයක් යැයි විවේචනය කළ ද, එය සමාජීය අවශ්‍යතාවයක් බව .................................... මහතා අගය කර ඇත.

15 පසුකාලීනව කණ්ඩායම් සංගීතයේ ජනප්‍රිය වූ ''වාග්ගේයකාර'' යන නමින් හැඳින් වූ ගායකයකු ලෙස .................................... මහතා හැඳින්විය හැකිය.

- **අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 16 | රාගයක කිසිසේත් නොයෙදෙන ස්වර | විවාදී ස්වර |
| 17 | රාගයක ප්‍රබලතම ස්වර දෙකට අමතරව යෙදෙන ඉතිරි ස්වර | වර්ජිත ස්වර |
| 18 | රාගයේ ජීව ස්වර | සංවාදී ස්වර |
| 19 | රාගයේ දෙවන ප්‍රධාන ස්වරය | වාදී ස්වර |
| 20 | රාගයේ නොයෙදෙන නමුත් රාග අලංකාරය සඳහා යොදා ගන්නා ස්වර | අනුවාදී ස්වර |

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01 A - ගමරි, ගප, මගමරිස

B - ගරිසධ, සරිග, පග, ධපග, රිස

(i) ඉහත A, B ස්වර සංගති වලට අයත් රාග දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) A රාගයේ මේලය, ජාතිය, ගායන සමය හා වාදී ස්වරය ලියන්න. (ලකුණු 02)

(iii) B රාගයට අයත් මධ්‍යලය ගීතයක ස්ථායි අන්තරා කොටස් දෙක ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06)

02 (i) අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණයේ දී යොදා ගන්නා ප්‍රධාන කොටස් තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) පාසල් පද්ධතියේ භාවිතාවන අපරදිග සංගීත භාණ්ඩ 04 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) සංගීත භාණ්ඩයක දළ රූප සටහනක් ඇඳ කොටස් දෙකක් නම් කරන්න. (ලකුණු 03)

03 පහත දක්වා ඇත්තේ රංග සම්ප්‍රදායන් දෙකකට අයත් ගී පාදයන් ය.

A - ''වාසනා දිනේකි මේක''

B - ''සෝබාව දේ මෙපුර''

C - ''දූක්කොත් පද්මාවතී''

D - ''හනික වරෙව් කොල්ලනේ''

(i) ඉහත රංග සම්ප්‍රදායන් දෙක නම් කර ඒවාට අදාළ ගී පාද වෙන් වෙන්ව ලියන්න. (ලකුණු 04)

(ii) ඉහත ABCD අක්ෂරවලින් හැඳින්වෙන ගී පාද වලට අදාල නාට්‍යයේ නම් ඉංග්‍රීසි අක්ෂර සමඟ ලියන්න. (ලකුණු 04)

(iii) ඉහත රංග සම්ප්‍රදායන් දෙකෙන් ඔබ කැමති එක් රංග සම්ප්‍රදායක විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

04


| ධි | න | තිං | ති | ධා | ධිං | තා |
|---|---|---|---|---|---|---|

(i) ඉහත අවනද්ධ අක්ෂර යොදාගෙන නිර්මාණය කරගත හැකි නිර්දේශිත මිශ්‍රමත් කැටි සහිත හින්දුස්ථානි තාල දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉහත අවනද්ධ අක්ෂර වලින් නිර්මාණය වී ඇති මිශ්‍ර මත් තැටි සහිත හින්දුස්ථානි තාලයක් මාත්‍රා තාල සංඥා සහිතව තාලානුකූලව ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(iii) ඉහත සඳහන්වන හින්දුස්ථානි තාල දෙකට ගැලපෙන දේශීය තිත් දෙක හා බටහිර තාල රූප දෙක නම් කරන්න. (ලකුණු 04)

05 (i)




ඉහත රූප සටහන් වලින් දක්වෙන බටහිර සංගීතයේ එන සංකේත නම් කරන්න. (ලකුණු 06)

(ii) F මේජර් ස්කේලයට අයත් ස්වර හා C මයිනර් ස්කේලයට (F major හා C minor) අයත් ස්වර ඉංග්‍රීසි අක්ෂර වලින් ලියන්න. (ලකුණු 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

01 2 02 3 03 2 04 1 05 3 06 4 07 1 08 1
09 1 10 2 11 නෙවිල් ප්‍රනාන්දු 12 ලා සිලනියන්ස් 13 ජිප්සීස් හා ත්‍රීසිස්ටර්ස්
14 ෂෙල්ටන් ප්‍රේමරත්න 15 ක්ලැරන්ස් විජේවර්ධන 16 වර්ජිත ස්වර
17 අනුවාදී ස්වර 18 වාදී ස්වර 19 සංවාදී ස්වර 20 විවාදී ස්වර (1 x 20 = 20)

## II කොටස

01 (i) A - බිලාවල් රාගය B - භූපාලි රාගය (ලකුණු 02)

(ii) මධ්‍යලය ගීතය නිවැරදිව ස්වර ප්‍රස්තාරකර ඇත්නම්. (ස්ථායි - ල.03, අන්තරා - ල.03) (ලකුණු 06)

(iii) A රාගයේ මේලය - බිලාවල්
ජාතිය - සම්පූර්ණ
ගායන සමය - දිවා ප්‍රථම ප්‍රහර
වාදී ස්වරය - ග (ලකුණු ½ x 4 = 2)

02 (i) 1. strings 2. wind 3. percussion (ලකුණු 03)

(ii) Trumpet, side drum, Bass drum, clarinet වැනි බටහිර සංගීත භාණ්ඩ 04 ක් ලියා ඇතිවිට (ලකුණු 04)

(iii) සංගීත භාණ්ඩයේ දළ රූප සටහනට (ල.01) (කොටස් දෙකක් ලකුණු කිරීමට ලකුණු 02)

03 (i)
- නූර්ති - වාසනා දිනේකි, දැක්කොත් පත්මාවතී
- නව නාට්‍ය - සෝබාවදේ මෙපුර, හනික වරෙව් කොල්ලනේ, රංග සම්ප්‍රදායන් දෙක නම් කිරීමට (ල.02), ගී පාද නම් කිරීමට (ලකුණු ½x4 = ල.02)

(ii) A - ශ්‍රී වික්‍රම නූර්තිය B - තාරාවෝ ඉගිලෙති C - පත්මාවතී නූර්තිය D - බෙර හඬ (ලකුණු 04)

(iii) තෝරාගත් රංග සම්ප්‍රදායට අදාල විශේෂ ලක්ෂණ දෙකක් ලියා තිබූ විට (ලකුණු 02)

04 (i) ජප් තාලය / දීප් චන්දි තාලය (ලකුණු 02)

(ii) දීප් චන්දි තාලය හෝ ජප් තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කළ විට (ලකුණු 04)

(iii)
- සුළු මැදුම් දෙතිත $\frac{5}{8}$ හෝ $\frac{5}{4}$
- මැදුම් මහ දෙතිත $\frac{7}{8}$ හෝ $\frac{7}{4}$ (ලකුණු 04)

05 (i) A - Semibreve Rest B - Dotted minim Rest C - $B^b$ / නි
D - F / ම් E - Time signature F - Tie Mark (ලකුණු 06)

(ii) F - major scale F G A $B^b$ C D E F
C minor scale C D $E^b$ F G $A^b$ $B^b$ C (ලකුණු 04)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

9 ශ්‍රේණිය

# පෙරදිග සංගීතය

## ප්‍රායෝගික පරීක්ෂණය

01 බිලාවල් හා භූපාලි යන රාග දෙකෙන් කැමති රාගයක පහත සඳහන් කොටස් ගායනය හෝ වාදනය.

(i) ආරෝහණ, අවරෝහණ (ලකුණු 02)

(ii) ස්ථායි (ලකුණු 04)

(ii) අන්තරා (ලකුණු 04)

02 ඉහත තෝරා නොගත් රාගයෙහි සර්ගම් ගීතය ගායනය හෝ වාදනය. (ලකුණු 10)

03 නිර්දේශිත නූර්ති ගීතයක් ගායනය හෝ වාදනය. (ලකුණු 10)

04 නිර්දේශිත නව නාට්‍ය ගීතයක් ගායනය හෝ වාදනය. (ලකුණු 10)

05 ඔබ කැමති ස්වර වාද්‍ය භාණ්ඩයකින් කැමති ගීතයක් වාදනය. (ලකුණු 05)

06. යතුරු පුවරුවෙන් කැමති ගීතයක් වාදනය. (ලකුණු 05)